**ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය**
**முதியோர்களுக்கான தேசிய செயலகம்**

# <u>ජංගම සෞඛ්‍ය සායන වැඩසටහන 2026</u>

- **හැඳින්වීම**

වයස අවුරුදු 60 ඉක්මවූ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ කායික හා මානසික සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලෙ, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, දිස්ත්‍රික්කයට අදාළ සෞඛ්‍ය අංශ, , ප්‍රජා සංවිධානවල සහභාගිත්වයෙන් මෙම ජංගම සෞඛ්‍ය සායන වැඩසටහන ශ්‍රී ලංකාව පුරා දිස්ත්‍රික් 25 තුළ ක්‍රියාත්මක කෙරේ. ඒ අනුව වැඩිහිටි තැනැත්තන්ගේ කායික හා මානසික සුභසාධනය සඳහා **භාණ්ඩාගාර අරමුදලේ** මූල්‍ය දායකත්වයෙන්, ශ්‍රී ලංකාවේ වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික ප්‍රතිපත්තියේ 6.2 වගන්තියට සමගාමීව 2000 අංක 9 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පණතේ 13 වන වගන්තිය ප්‍රකාරව සහ **"පොහොසත් රටක් ලස්සන ජීවිතයක්"** යන රජයේ ජාතික ප්‍රතිපත්ති ප්‍රකාශයට සමගාමීව මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරේ. මෙම සත්කාරය තුළින් අපේක්ෂිත අරමුණ වනුයේ

- තම සෞඛ්‍ය අවශ්‍යතා සපුරා ගැනීම සඳහා දුර බැහැර යාමට ආර්ථික හැකියාවක් නොමැති මෙන්ම කායික හා මානසික ශක්‍යතාවයෙන් අඩු වැඩිහිටි ප්‍රජාව සඳහා ඔවුන් වාසය කරන වසම තුළටම ගොස් උසස් ප්‍රමිතියෙන් යුතු සෞඛ්‍ය සේවාවක් සැපයීම.
- සෞඛ්‍ය පහසුකම් සඳහා වැඩිහිටි ප්‍රජාවට ඇති ප්‍රවේශතාවය වැඩි දියුණු කිරීම.
- වැඩිහිටි තැනැත්තන් සඳහා නිරෝගිමත් වැඩිහිටි දිවියක් උදාකරදීම වේ.

වෛද්‍ය කාර්යය මණ්ඩලයේ සහභාගිත්වයෙන් බෝ නොවන රෝග පිළිබඳ ජංගම සෞඛ්‍ය සායන වැඩසටහන පැවැත්වීමට නියමිත අතර ඊට සමගාමීව , සායනය පවත්වන ස්ථානයට පැමිණිය නොහැකි ඇඳන්ගත රෝගීන් වෙනුවෙන් එම රෝගීන් සිටින ස්ථානය වෙතට ගොස් පරීක්ෂා කිරීමේ වැඩසටහනක් ලෙසද මෙය ක්‍රියාත්මක කරනු ලැබේ. තවද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ උපදේශන අංශයේ සහභාගීත්වයෙන් මානසික ගැටළු සඳහා මනෝවිද්‍යාඋපදේශන කටයුතු සිදු කරනු ලැබේ

- **ක්‍රියාත්මක ක්‍රමවේදය**

දිවයින පුරා සෑම දිස්ත්‍රික්කයක පහත කරුණු සැලකිල්ලට ගෙන වැඩසටහන ක්‍රියාත්මක කිරීමට නියමිත අතර එක දිස්ත්‍රික්කයක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 3 ක ක්‍රියාත්මක කරනු ලැබේ.ඒ අනුව දිවයින පුරා ජංගම සෞඛ්‍ය සායන 75 ක් ක්‍රියාත්මක කරනු ලැබේ. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසජංගම සෞඛ්‍ය සායනයක් පැවැත්වීම සඳහා රු 100,000.00 ක මුදලක් ලබා දෙනු ලැබේ.

දිස්ත්‍රික් ලේකම් විසින් පහත සඳහන් කරුණු සලකා බලා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තෝරාගත යුතුය.

1. වයස අවුරුදු 60 ඉක්මවූ ජ්‍යෙෂ්ඨ පුරවැසිය ජනගහණය.
2. එම වැඩිහිටියන් අතරද අඩු ආදායම්ලාභී ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ගණන
3. මූලික රෝහලට හෝ දිස්ත්‍රික් රෝහලට ඇති දුර.

4. ප්‍රවාහන දුෂ්කරතාවය හා ඇඳන් ගත රෝගීන් ප්‍රමාණය.
5. බෝ නොවන රෝග ව්‍යාප්තිය( මේ සඳහා ප්‍රාදේශීය වෛද්‍ය නිලධාරින්ගේ නිර්දේශ ලබා ගැනීම යෝග්‍ය වනු ඇත.)

මෙම වැඩසටහන සඳහා ග්‍රාමීය සංවර්ධන ,සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය මඟින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ප්‍රතිපාදන නිදහස් කරනු ලැබේ.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් අදාල ඉල්ලීම් දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත යොමු කර ප්‍රතිපාදන ලබාගත යුතුය.

ඒ අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් අවශ්‍ය අග්‍රිම භාණ්ඩාගාරයෙන් ලබාගෙන සෞඛ්‍ය සායන වැඩසටහන සිදු බළ යුතුය.

ජංගම සෞඛය සායන ක්‍රියාත්මක වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරි /සංවර්ධන නිලධාරි (වැඩිහිටි),සමාජ සේවා නිධාරි /සංවර්ධන නිලධාරි (සමාජ සේවා ) වැඩසටහන ක්‍රියාත්මක වන කොට්ඨාශය අයත් දිස්ත්‍රික්කයෙහි වැඩිහිටි විෂය භාරව ඇති දිස්ත්‍රික් වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරි/සංවර්ධන නිලධාරි (වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන) මෙම වැඩසටහන සාර්ථක කර ගැනීම වෙනුවෙන් තම පූර්ණ දායකත්වය ලබා දිය යුතුය.

වැඩිහිටියන්ගේ කායික මානසික සුභසාධනය වෙනුවෙන් සෞඛ්‍ය අංශය,මනෝවිද්‍යා උපදේශන අංශය,වෘද්ධ විද්‍යා අංශය හා උගුර - කණ - නාසය අක්ෂි වැනි ක්ෂේත්‍රයන්ට අදාල වෛද්‍යවරු,දේශකවරු,තාක්ෂණික නිලධාරින් ,මනෝ විද්‍යා උපදේශකවරු,ජංගම රසායනාගාරද මෙම වැඩසටහන සාර්ථක කර ගැනීම වෙනුවෙන් සම්බන්ධ කර ගැනීමට කටයුතු කළ යුතුය.

ජංගම සෞඛ්‍ය සායන වැඩසටහන තුළදී බෝ නොවන රෝග පිළිබ ද රසායනාගාර පරීක්ෂණ ,උගුර කණ නාසය අක්ෂි යන ක්ෂේත්‍රයන්ට අදාල පරීක්ෂණ කටයුතු වැඩිහිටියන්ගේ මානසික ගැටළු විසඳීම වෙනුවෙන් මනෝ විද්‍යා උපදේශන කටයුතුද සිදු කළ යුතු අතර, මෙම වැඩසටහන පිළිබඳ දැනුවත් කිරීම් පූර්ව ප්‍රචාරක අවස්ථාවන්හිදී එම කටයුතු පිලිබඳ දැනුවත් කළ යුතුවේ.ජංගම සෞඛ්‍ය සායන වැඩසටහනට සමගාමීව එම ස්ථානයට ළඟාවිය හැකි නොහැකි කායික හා මානසික වශයෙන් දුර්වල වූ ඇඳන් ගත රෝගීන් වැඩිහිටියන් පරීක්ෂා කිරීම සඳහා එම රෝගීන් සිටින ස්ථානයට වෛද්‍යවරු රැගෙන යාමේ ක්‍රමවේදයක්ද දියත් කළ යුතුය.

බෝ නොවන රෝග වලින් පෙළෙන වැඩිහිටියන්ගේ පරීක්ෂන කටයුතු සඳහා ඔවුන් නිරාහාරව පැමිණෙන බැවින් ඒ සඳහා අනුග්‍රාහක බවතුන්ගේ (ව්‍යාපාරික ප්‍රජාව,දානපතියන්,වැඩිහිටි කමිටු හා වෙනත් සංවිධාන) දායකත්වය ලබාගත හැකිය. වැඩසටහනට සහභාගී වූ වැඩිහිටියන්ගේ නාමලේඛණයක්ද ඔබ විසින් පිළයෙල කල යුතුව ඇත. වැඩසටහන අවසන් වී මාසයත් ඇතුළක ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් වැඩ අවසන් වාර්තාව ලබා දීමට කටයුතු කළ යුතුය.

මෙම වැඩසටහන අවසන් වි වැඩ අවසන් වාර්තාව කඩිනමින් ලැබීමට සැලැස්විය යුතු අතර,එහිදී වැඩසටහනට සහභාගී වු වැඩිහිටියන්ගේ අත්සන් ලේඛනය සහ වැඩසටහනට සහභාගී නිළධාරි මඩුල්ලගේ අත්සන් ලේඛනය ,වැඩසටහනට අදාළ ඡායාරූප ද එහි අඩංගු විය යුතුය.

ඉහත කර්තව්‍ය සාර්ථකව ඉෂ්ට කිරීම තුළින් වැඩිහිටියන්ගේ සැඳැ සමයේ කායික හා මානසික නිරෝගී සුවයෙන් හා ආත්ම ගරුත්වයක් ,ස්වාධීනත්වයක් ඇතිව ජීවත් වීමේ පරිසරයක් නිර්මාණය කිරීමට අපහට හැකිවනු ඇත.